NDB බැංකුව
අනාගත බැංකුකරණයේ පෙරගමන්කරු

# ශේෂය පැවරීමේ නියමයන් සහ කොන්දේසි

1. නැෂනල් ඩිවලෙප්මන්ට් බෑන්ක් (NDB) විසින් පිරිනමනු ලබන ශේෂය පැවරීමේ වැඩසටහන (BT සැලසුම) ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත් හැරෙන්නට, NDB ප්ලැටිනම්, සිග්නේචර් සහ ඉන්ෆිනිටි NDB ප්‍රධාන ක්‍රෙඩිට්කාඩ්පත්හිමියන් සඳහා පමණක් ලබා දෙන විශේෂ පහසුකමකි. මෙහි දී එවැනි ප්‍රධාන ණයපත්හිමියන් "ණයපත්හිමියා" ලෙස හඳුන්වනු ලබයි.

2. "BT සැලසුම" සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේ දී ක්‍රෙඩිට්කාඩ්පතෙහි පවතින ශේෂයට යටත්ව අවම පැවරීම් මුදල වශයෙන් ශ්‍රී.ල.රු. 50,000/ ක හිඟ ශේෂයක් සහ අනුමත ණය සීමාවෙන් 80% ක් දක්වා පැවරීම සඳහා කාඩ්පත්හිමියාට හිමිකමක් ඇත්තේ ය. කෙසේ වුව ද, BT සැලැස්ම සඳහා අයදුම් කරන අවස්ථාවේ දී NDB ණයපතෙහි පවතින භාවිතයට ගත හැකි ණය සීමාවට යටත් වේ.

3. කාඩ්පත්හිමියා විසින් පහත දැක්වෙන සැකසුම් ගාස්තුවක් සමග මාස 60 ක් දක්වා මුදල් ආපසු ගෙවනු ලැබිය හැකි ය.

| කාලසීමාව | මාස 12 | මාස 24 | මාස 48 | මාස 60 |
|---|---|---|---|---|
| මාසයකට සැකසුම් ගාස්තුව | 0% | 0.50% | 0.70 % | 0.70 % |
| වාර්ෂික සඵල අනුපාතිකය (AER) | 0% | 11.13% | 15.01% | 14.76% |
| ආරම්භක ගාස්තුව (ශ්‍රීලරු) | 5,000 | 5,000 | 5,000 | 5,000 |

4. ඉල්ලුම්කරු විසින්, මෙම පහසුකම ලබා ගැනීම සඳහා ආසන්නතම මාසයේ වෙනත් බැංකු ක්‍රෙඩිට්කාඩ් ප්‍රකාශයක් ද සමග (OBC) යථා පරිදි සම්පූර්ණ කරන ලද BT ඉල්ලුම්පත්‍රයක් contact@ndbbank.com වෙත යොමු කිරීම හෝ ආසන්නතම NDB බැංකු ශාඛාව වෙත භාරදීම කරනු ලැබිය යුතු ය.

5. බැංකුවේ ඇගයීම් ක්‍රියාවලිය තුළ දී යම් BT ඉල්ලුම්පත්‍රයක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතය NDB බැංකුව සතු වේ.

6. (5) වන වගන්තියට තවදුරටත් වූ වශයෙන් කාඩ්පත්හිමියාගේ පවත්නා ණය සීමාවට අනුව "BT සැලසුමේ" මුදල තීරණය කර අනුමත කිරීමේ අයිතිය NDB බැංකුව සතු වේ.

7. NDB බැංකුව විසින්, වැඩ කරන දින 3 ක් ඇතුළත අනුමත BT සැලසුම් මුදල CEFT පැවරීමක් ආකාරයෙන් අදාළ වෙනත් බැංකු ක්‍රෙඩිට්කාඩ්පතට පවරනු ලැබේ.

8. BT මුදල කලින් ගෙවා නිරාකරණය කිරීමේ දී, හිඟ BT මුදලින් 4% ක කලින් ගෙවා නිරාකරණය කිරීමේ ගාස්තුවක් ගෙවීමට යටත් වේ.

9. ක්‍රෙඩිට්කාඩ් ගිණුම මත ණය සීමාව BT මුදල් ප්‍රමාණය දක්වා අවහිර කර පසුව එළඹෙන මාසවල දී මාසික වාරික මුදල් බිල්පත් කර ගෙවා නිම කිරීමෙන් පසුව සහ එසේ ගෙවා නිරාකරණය කිරීමේ දී එම ණය සීමාව නිදහස් කරනු ලැබේ.

10. යම් නිශ්චිත මාසයක NDB ක්‍රෙඩිට්කාඩ්පත් ගෙවීම් සිදු කළ යුතු දිනයේ දී හෝ එම දිනයට පෙරාතුව BT වාරිකය ද ඇතුළුව ප්‍රකාශනයේ සඳහන් සමස්ථ හිඟ මුදල ගෙවා නිරාකරණය කර නොමැති අවස්ථාවක දී, සම්මත ක්‍රෙඩිට්කාඩ්පත් නියම සහ කොන්දේසි ප්‍රකාරව ක්‍රෙඩිට්කාඩ් හිඟ මුදල් මත අදාළ වන සම්මත පොළී අනුපාතිකය අය කරනු ලැබේ.

11. කාඩ්පත්හිමියා විසින් ගෙවීම් සිදුකිරීම පැහැර හැර ඇති අවස්ථාවක දී, හිඟ BT මුදල කලින් වසා දමා සමස්ථ හිඟ මුදල ක්‍රෙඩිට්කාඩ්පත් ගිණුමට බැර කිරීමේ අයිතිය NDB බැංකුව සතු වේ.

12. කාඩ්පත්හිමියාගේ වෙනත් බැංකු ක්‍රෙඩිට්කාඩ්පත්වල ගෙවීම් කළ යුතු දිනයට පෙරාතුව ගෙවීම් කිරීමේ දී NDB බැංකුවට සිදුවන ගෙවීම් සිදුකිරීම අපොහොසත් වීම හෝ ගෙවීම් ප්‍රමාදවීම් හේතුවෙන් කාඩ්පත්හිමියාට දැරීමට සිදු විය හැකි වෙනත් බැංකු ක්‍රෙඩිට්කාඩ් හිඟමුදල් මත පොළිය හෝ වෙනත් යම් වැඩිපුර ගෙවීමක්, හිඟ මුදල් ගාස්තු, ප්‍රමාද ගාස්තු, මූල්‍ය ගාස්තු හෝ ඉහත සඳහන් වෙනත් බැංකු ක්‍රෙඩිට්කාඩ් ගාස්තු/ වගකීම් ආකාරයෙන් වන සියලු හෝ යම් පාඩු සම්බන්ධයෙන් NDB බැංකුව වගකියනු නොලබන අතර කාඩ්පත්හිමියා විසින් එවැනි පාඩුවලට එරෙහිව NDB බැංකුව හානිපූරණය කර නිදහස්ව තබනු ලැබිය යුතු වේ.

13. මෙම ප්‍රදානයේ නියමයන් කාඩ්පත් ගිවිසුමේ සඳහන් නියමයන්ට අතිරේකව විය යුතු අතර එමගින් කාඩ්පත් ගිවිසුමේ නියමයන් අභිබවා යෑමක් සිදු නොවිය යුතු ය, මෙම පිරිනැමීම තෝරාගත් කාඩ්පත්හිමියන් සඳහා වන විශේෂ පහසුකමක් ආකාරයෙන් වන අතර මෙහි සඳහන් කිසිවක් මගින් කාඩ්පත් ගිවිසුමේ (Cardholder Agreement) සඳහන් නියම හා කොන්දේසිවලට අගතිගාමී නොවිය යුතු මෙන්ම බලපෑමක් නොවිය යුතු ය.